ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන

අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007

**ESP 1109 - ළමා අයිතිවාසිකම්**

165

**කාලය පැය තුනයි.**

---

දිනය - 2007.12.02 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II වන කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I - කොටස

01. ළමයින්ගේ තත්වය සුරක්ෂිත කිරීම සඳහා පෘතුගීසි හා ලන්දේසි යුගවලදී ගන්නා ලද පියවර කෙටියෙන් පැහැදිළි කරන්න.

02. යහපත් ළමා සුභසාධන ප්‍රතිපත්තියක් උදෙසා 1939 දී ගන්නා ලද ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න.

03. ළමා අයිතිවාසිකම් සඳහා පදනම් වන මූලධර්ම දක්වන්න.

04. ළමයින්ගේ ජීවත්වීමට හා සංවර්ධනයට තර්ජනයක්ව පවතින අවදානම් සාධක සඳහන් කරන්න.

05. ළමයින් සතු "සහභාගිත්වය සඳහා ඇති අයිතිය" යන්න කෙටියෙන් පැහැදිළි කරන්න.

06. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය බහුලව සිදුවන ආකාර පහක් දක්වන්න.

07. ළමා අයිතිවාසිකම් පිළිබඳව ඵලදායී සන්නිවේදනය කෙරෙහි බාධාකාරී ලෙස බලපාන සාධක නම් කරන්න.

08. ළමා අපයෝජනය ශ්‍රී ලංකාව තුළ සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට නොහැකිවීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු තුනක් නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. (i) යටත් විජිත යුගයට පෙර සමයේ ළමා අයිතීන් සම්බන්ධව පැවති තත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(ii) නිදහසින් පසු ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර පැහැදිළි කරන්න. (ලකුණු 12)

10. (i) ළමයා සම්බන්ධ "අයිතිවාසිකම්, අවශ්‍යතා හා යුතුකම්" යන යෙදුම්වල වෙනස පැහැදිළි කරන්න. (ලකුණු 08)

(ii) ළමා අයිතිවාසිකම් සඳහා පදනම්වන මූලධර්ම ප්‍රවර්ධනයේ දී බාධාකාරී ලෙස බලපාන සාධක විභාග කරන්න. (ලකුණු 12)

11. (i) ජීවත්වීමට හා සංවර්ධනයට අදාළ ළමා අයිතිවාසිකම් හා සම්බන්ධ ප්‍රධාන සංකල්ප පැහැදිළි කරන්න. (ලකුණු 08)

(ii) ජීවත්වීමට හා සංවර්ධනයට අදාළ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර විභාග කරන්න. (ලකුණු 12)

12. (i) ළමයාගේ සමාජ සංවර්ධනය කෙරෙහි දෙමාපිය හදාවඩා ගැනීමේ ශෛලීන් බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ළමයා කෙරෙහි පවුලෙන් සිදුවන අහිතකර බලපෑම් සමනය කිරීම සඳහා පාසල් පරිසරය සකස් කළ හැකි ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 12)

13. (i) ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපන පද්ධතිය තුළට ළමා අයිතිවාසිකම් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති උත්සාහයන් පැහැදිළි කරන්න. (ලකුණු 10)

(ii) අවාසිදායක තත්වයක පසුවන ප්‍රජාවන් ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා යොදාගත හැකි ගැලපෙන සන්නිවේදන ක්‍රමෝපාය යෝජනා කරන්න. (ලකුණු 10)

14. පහත සඳහන් **තුනක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ළමයාගේ පෞරුෂ සංවර්ධනය

(ii) අපත්‍යීකරණය

(iii) ළමා ආරක්ෂක අධිකාරිය

(iv) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය

(v) විශේෂ අවස්ථාවන්හි පසුවන ළමයින්

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි.-